# පළමුවන තේමාව - ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය

5

## 1.5. "වචනය තෙම ද මාංශ වුණේ ය. අප සමග ද වාසය කළේ ය."

"ආරම්භයේ දී ධර්මයාණෝ සිටි සේක; ධර්මයාණෝ දෙවියන් වහන්සේ සමග සිටි සේක; ධර්මයාණෝ දෙවියන් වහන්සේව ම සිටි සේක."
(ජුවාම් 1:1)



දේව පුත්‍රයා තම දේවත්වය පසෙක ලා, අප ගලවා ගැනීම පිණිස, මනුෂ්‍ය ස්වභාවය ගෙන, මෙලොවට වැඩම කළ සේක. එය සිදු වූයේ ඓතිහාසික පොරොන්දුවක් ඉටුවීමක් ලෙස ම ය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

"සමිඳාණන් වහන්සේ ම නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න, කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහි කරන්නී ය; "එම්මානුවෙල්" යන නම ඔහුට තබන්නී ය." (යෙසායා 7:14)

නාසරතයේ ජේසුස් වහන්සේ, පියාණන් වහන්සේගෙන් ජනිතවන දේව පුත්‍රයාණන් ය. අප උන්වහන්සේ හා සමාන වන පිණිස උන්වහන්සේ අප හා සමාන මිනිස් බව ගෙන මෙලොවට වැඩම කර අප අතර වාසය කළ සේක. අති විශිෂ්ට "මාංශගත වීමේ අභිරහස" එය යි.



දේව දූතයා ඇය සිටි තැනට පැමිණ "විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ; ස්වාමින් වහන්සේ ඔබ සමග ය" යි කීය. එහෙත් ඇ ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක් දැ යි සිත සිතා සිටියා ය. දේව දූතයා ඇට කතා කොට, මරියාණනි, බිය නොවන්න, ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාද ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය. ඔවුන් වහන්සේට 'ජේසුස්' යන නාමය තබන්න. ඔවුන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක; පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක; ඔවුන් වහන්සේගේ පියා වූ දාවිත්ගේ සිංහාසනය දෙවි සමිඳාණන් වහන්සේ ඔවුන් වහන්සේට ප්‍රදානය කරන සේක; ඔවුන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහට ම රජකම් කරන සේක; ඔවුන් වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නො දක්නේ ය" යි කීය. (ලූක් 1:2833)

ජොහාන් ශුභාරංචිය ප්‍රකාශ කරන පරිදි, 'වචනය තෙම' (ධර්මයාණෝ, වාක්‍යයාණෝ) මාංශගත වී, අප සමග ජීවත් වූ බවත්, ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ මනුෂ්‍යයා වූ බවත් අපි අදහා ගත යුතු වෙමු. දෙවියන් වහන්සේ අපට ප්‍රේම කරන්නේ මිනිස් හදවතිනි. ක්‍රිස්තුන් වහන්සේ සැබෑ දෙවියන් මෙන්ම සැබෑ මනුෂ්‍යයා ද වූ බැවින් ඔවුන් වහන්සේ තුළ සියලු යහපත් මිනිස් ගුණාංග ප්‍රකාශ විය. ඒ තුළින් අපට මනුෂ්‍යත්වයේ උතුම්කමත් එකිනෙක මනුෂ්‍යයාට අප ගරු කළ යුතු බව හා මිනිස් අයිතීන් ආරක්ෂා කිරීමටත් සියලු භේද අත්හැර මිනිසුන් ලෙස කටයුතු කිරීමටත් ආදර්ශ ලබාදුන් බව හොඳින් අවධාරණය කරගත යුතු ය. එසේ ම මාංශගත වූ ධර්මයාණෝ මිනිස් සංහතියට දෙවියන් වහන්සේගේ ම 'වචනය' ප්‍රකාශ කළ බව හා දේව පණිවිඩය අපට ඉගැන්වූ බවත් ශුභාරංචිය පැහැදිලි කරයි.


"අපට ළදරුවෙක් උපන්නේ ය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය; එතුමාණෝ අපේ රජු වන සේක. අසිරිමත් උපදේශකයාණෝ ය; ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය; සදාතන පියාණෝ ය; සැමගේ 'සාමයේ කුමාරයාණෝ ය.' යි කියනු ලබන සේක. එතුමන්ගේ රාජ බලය වැඩි වර්ධනය වන්නේ ය; එම රාජ්‍යයේ සාමයට කෙළවරක් නො වන්නේ ය; මෙතැන් සිට සදහට ම දාවිත් රජුගේ සිහසුනේ වැඩ හිඳින එතුමන්ගේ රාජ්‍යය ස්ථිරව පිහිටුවන ලෙස එතුමාණෝ යුක්තියෙන් ද ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන සේක. සව් බලැති සමිඳුන්ගේ උද්‍යෝගයෙන් මෙය අධිෂ්ඨාන කළ සේක."

(යෙසායා 9:67)

**යහපත් වූ ද ප්‍රඥා සම්පන්න වූ ද දෙවියන් වහන්සේ අපට තමන් වහන්සේ ප්‍රකාශ කරමින්, තමන් වහන්සේගේ කැමැත්තේ අභිරහස, අපට දන්වා වදාළ සේක. මේ අරමුණ අනුව මනුෂ්‍යයා ක්‍රිස්තුන් වහන්සේ මඟින්, ශුද්ධාත්මයාණන් තුළ, පියාණන් වහන්සේ වෙත, ප්‍රවේශ වීමේ බලය ලැබ, දේව ස්වභාවයට පංගුකාර වන්නේ ය. එහෙයින්, මේ ප්‍රකාශය අනුව, අදෘශ්‍යමාන දෙවියන් වහන්සේ, තමන්ගේ විපුල ප්‍රේමයෙන් මනුෂ්‍යයන්ට මිතුරකු මෙන් කථා කළ සේක. ඔවුන්ට තමන් වහන්සේ සමඟ, සාමාජිකත්වයක් දැරීමට කැඳවන පිණිස ඔවුන් අතරේ ජීවත් වන සේක.**

**දෙවන වතිකාන මන්ත්‍රණ සභා දේව ප්‍රකාශනය පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව02**

## ක්‍රිස්තුන් වහන්සේගේ අනාවරණයඃ



ගිළිහුණ දේව සබඳතාව යළි ගොඩනැගීම සඳහා, තම දේවත්වය හිමි බලය මහිමය, තේජස හිස් කර මිනිස් බව ගත් ජේසුස් වහන්සේ තම

- දුක් විඳීම
- මරණය
- උත්ථානය

තුළින් දේව සැලැස්ම මුළුමනින් ම අප වෙත, අනාවරණය කළ සේක. මරණයෙන් උත්ථානවීම හේතු කොටගෙන උන්වහන්සේ දේව පුත්‍රයාණන් බවට ප්‍රබල සාක්ෂියක් දුන් සේක.

ඔවුන්වහන්සේ, දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය, තමන් විසින් බදාගෙන ම තබාගත යුතු වස්තුවකැ යි නො සිතා, එය ඉවත ලා, සේවකයෙකුගේ ස්වරූපයක් ගෙන, අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිමින්, උන්වහන්සේ මරණය, එනම් කුරුසයේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක.

එබැවින්, දෙවියන්වහන්සේ, ඔවුන් වහන්සේ අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය, ඔවුන් වහන්සේට දුන් සේක.

(පිලිප්පි 2:69)


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

දෙවියන් වහන්සේ ගැලවීමේ ඉතිහාසය පුරා, නොයෙක් අවස්ථාවල දී විවිධාකාරයෙන් තමන් වහන්සේ අනාවරණය කර, අවසානයේ දී, උන්වහන්සේගේ පුත්‍රයාණන් මගින් අපට කථා කළ සේක. එම නිසා උසස් ම දේව අනාවරණය ලෙස ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට පැමිණ, අප සමග වාසය කිරීම දැක්විය හැකි ය.

එය අපට දෙවියන් වහන්සේගේ ම ජීවිතය ගැන ලබා දුන් උතුම් ම අනාවරණය වන සේක. තවද, ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළ වචන, ක්‍රියා, සලකුණු හා ප්‍රාතිහාර්ය යන සියල්ලට ම වැඩියෙන් තම මරණය, උත්ථානය හා ශුද්ධාත්මදානය තුළින් දෙවියන් වහන්සේ ව අපට අනාවරණය කළ සේක.

අපරිමිත ආදරය නිසා ම, එම අනාවරණය පිළිගැනීමට, ඔවුන් වහන්සේ ශුද්ධාත්මයාණන් මගින් උදව් ලබා දෙන සේක. එබැවින් එය විශ්වාසයෙන් පිළිගෙන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස ගැලවීමේ ආරාධනයට පිළිතුරු දෙමු.

**මේ ගැනත් සිතන්න, පිළිතුරු දෙන්න.**

1. අප වෙනුවෙන් ජේසුස් වහන්සේ මාංශගත වූවාක් මෙන් අද අසරණ ව සිටින අය වෙනුවෙන් ඔබට කළ හැකි දේ මොනවා ද?

2. ඔබේ පවුලේ කටයුතුවල දී ඔබට කැප වී කටයුතු කිරීමට හැකි ද?

3. ප්‍රසාද නිධාන මගින් පෝෂණය වන ඔබට අනාවරණය වන දෙවිඳුන්ට, ඔබගේ ප්‍රතිචාරය කෙසේ දැක්විය හැකි ද?


4. ක්‍රිස්තුන් වහන්සේ මගින් දේව අනාවරණය සිදු වූ ප්‍රබලතම අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

**ඔබේ ජීවිතයට..**


❐ දිනපතා තිරින්දාදී සීනු නාදය ඇසෙන විට මාංශගතවීමේ අභිරහස සිහි කර දෙවිඳුන්ට තුති දෙන්න. ඒ සඳහා තුන් කාලයේ ආරාධනය දිනකට වරක්වත් උච්චාරණය මෙනෙහි කරන්න.

## මෙනෙහි කිරීම සඳහා දේව වාක්‍යය


"තා සහ ස්ත්‍රිය අතර ද තගේ වංශය හා ඇගේ වංශය අතර ද බද්ධ වෛරය තබන්නෙමි. ඔහු තගේ හිස පොඩි කරන්නේ ය; තෝ ද ඔහුගේ විලුඹ දෂ්ට කරන්නෙහි ය." (උත්පත්ති 3:15)



***ආරම්භයේ දී වචනයේ තෙම වැඩූ විසූ සේක***



***ආදියේ දී විවිධ මාර්ගවලින්.....***



***දෙවියන් වහන්සේ දිවැසිවරුන් මගින් කථා කළ සේක.***

***අවසානයේ දී තම පුත්‍රයා මගින් කථා කළ සේක.***

